ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## <u>පුවත්පත් නිවේදනය</u>

### ඉන්දියාව ශ්‍රී ලංකා පොලිසියට මහින්ද්‍රා SUV ජීප් රථ ලබා දේ

ඉන්දියාවේ මහින්ද්‍රා සහ මහින්ද්‍රා සමාගම විසින් නිෂ්පාදනය කරන ලද SUV ජීප් රථ 125ක් සංකේතාත්මකව ශ්‍රී ලංකාවට භාර දීම 2022 දෙසැම්බර් 22 වන දින ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා විසින් සිදු කරන ලදී. මහ කොමසාරිස්තුමා මෙම ජීප් රථ මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මහතා වෙත භාර දුන් අතර එම අවස්ථාව සඳහා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් එස්. හෙට්ටිආරච්චි මහතා ඇතුළු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් සහ පොලිස්පති සී. ඩී. වික්‍රමරත්න මහතා ද සහභාගී වූහ.

2. මෙම ජීප් රථ 125 කලකට පෙර ඉන්දියානු රජය ශ්‍රී ලංකාවට ලබා දුන් ඇමරිකානු ඩොලර් මිලියන 100ක ණය පහසුකමක් යටතේ ශ්‍රී ලංකාවේ නීතිය ක්‍රියාත්මක කරන ආයතනයන්ට සහ සන්නද්ධ හමුදාවන්ට ලබා දීමට නියමිත වාහන 500කින් පළමු තොගය වේ. අති නවීන තාක්ෂණයෙන් යුත් මෙම වාහන දිවයින පුරා අවශ්‍යතා සපුරාලීම සහ ධාරිතා සංවර්ධනය සඳහා ඉවහල් වනු ඇත.

3. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සහයෝගීතාවය විවිධ ක්ෂේත්‍ර සහ අංශ පුරා පැතිරී ඇත. 'අසල්වැසියා ප්‍රථමයෙන්' යන ප්‍රතිපත්තිය අනුව ඉන්දියානු රජය සහනදායී ණය පහසුකම් යටතේ විවිධ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම ඇතුළු විවිධාකාර සහයෝගයන් ශ්‍රී ලාංකික ජනතාවට ලබා දේ. වර්තමානයේදී ද තවදුරටත් අඛණ්ඩව මෙම සහයෝගය ලබා දේ. ඉන්දියාව මේ දක්වා දුම්රිය, යටිතල පහසුකම්, ආරක්ෂක, පුනර්ජනනීය බලශක්තිය, ඛනිජ තෙල් සහ පොහොර සැපයුම් ආදි විවිධ ක්ෂේත්‍රයන් සඳහා ඇමරිකානු ඩොලර් බිලියන 3.2ක පමණ සහනදායී ණය පහසුකම් ලබා දී ඇත. මෙයට අමතරව ඉන්දියානු රජය 2022 මාර්තු මාසයේදී ආහාර, ඖෂධ, ඉන්ධන ආදි අත්‍යාවශ්‍ය භාණ්ඩ ලබා ගැනීම සඳහා ඉන්දීය රාජ්‍ය බැංකුව හරහා ඇමරිකානු ඩොලර් බිලියන 1ක සහනදායී ණය පහසුකමක් ද ශ්‍රී ලංකාවට ලබා දෙන ලදී.

***

2022 දෙසැම්බර් 23
කොළඹ